පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

නිපුණතාවය : ගිණුම්කරණ සමීකරණ

නිපුණතා මට්ටම :

1. ගිණුම්කරණ සමීකරණය හැඳින්වීම.
2. ගිණුම්කරණ සමීකරණ ගොඩනැගීම.
3. ව්‍යාපාරික ගණුදෙණු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය.

ව්‍යාපාරයක මුදලින් මැනිය හැකි ගනුදෙනුවක සිදුවන ද්විත්ව බලපෑම සමීකරණයක් තුළින් නිරූපණය කිරීම ගිණුම්කරණ සමීකරණය ලෙස හැඳින් විය හැකිය.

ගිණුම්කරණ සමීකරණයේ ප්‍රධාන සංරචක 3කි.

1. වත්කම්
2. වගකීම්
3. හිමිකම්

ඒ අනුව පහත ආකාරයන් යටතේ ගොඩනැගිය හැක.

1. අයිතිකරු පමණක් සම්පත් යොදා ඇති විට,

වත්කම් = හිමිකම්

2. අයිතිකරු හා බාහිර පාර්ශවයන් විසින් සම්පත් යොදා ඇති විට,

වත්කම් = හිමිකම් + වගකීම්

1. ඉන්දු ව්‍යාපාරය 20121 මාර්තු මාසයේ 01 දින ආරම්භ කරන ලදී. මාර්තු මස පළමු සතිය තුළ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. 2021.03.01 රු. 100 000 ආරම්භක ප්‍රාග්ධන ලෙස යෙදවීම
2. 2021.03.02 රු. 50 000ක කාර්යාල උපකරණ මිලදී ගැනීම
3. 2021.03.03 රු. 75000 කබැංකු ණයක් ලබා ගැනීම
4. 2021.03.04 රු. 40 000 ක තොග අත්පිට මුදලට ගැනීම.
5. 2021.03.05 රු. 25000 ක් වටිනා තොග රු. 35000කට විකිණීම
6. 2021.03.06 රු.ප්‍රචාරණ වියදම් ලෙස රු.7000 ක් දරණ ලදී.
7. 2021.03.07 රු.බැංකු ණය වාරිකය ලෙස රු. 10000 ක් ගෙවන ලදී.

ඉහත ගනුදෙණු වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයෙන් දක්වන්න.

2. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු 4ක බලපෑම ගිණුමකරණ සමීකරණය තුළ පහත සඳහන් පරිදි දක්වා ඇත.

වත්කම් = හිමිකම් + වගකීම්

1. වැඩි වේ = - + වැඩිවේ
2. වැඩි වේ = වැඩි වේ + -
3. - = වැඩි වේ + -
4. අඩුවේ = - + අඩුවේ

ඉහත බලපෑම් තුළ සිදුවිය හැකි ගනුදෙනු දෙක බැගින් සඳහන් කරන්න.